www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනයෙන් පසුව: කම්කරු පන්තිය සඳහා ඊළඟට කුමක්ද?

## After the Sri Lankan election: what next for the working class?

**විජේ ඩයස් විසිනි**

**2005 නොවැම්බර් 22**

*පහත පල වන ප්‍රකාශය ලියන ලද්දේ, නොවැම්බර් 17 දා ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරනයේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක විජේ ඩයස් විසිනි.*

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අපේක්ෂක මහින්ද රාජපක්ෂ දැන් ශ්‍රී ලංකාවේ නව විධායක ජනාධිපති ලෙස පත් වී තිබේ. කෙසේ වෙතත්, දුර දිග යන ව්‍යවස්ථාමය බලතල සහිත මෙම තනතුර දැරීමට රාජපක්ෂට කිසි සේත් ම ජනවරමක් නැත. ඒ මක් නිසා ද කිය තොත්, ඔහු තේරී පත් වූයේ රැවටිල්ලේ හා වංචාවේ පදනම මත වන හෙයිනි.

ඔහුගේ පාලනය යටතේ තම ජීවන තත්වයන් වැඩි දියුනු වනු ඇතැයි යන ව්‍යාජ බලාපොරොත්තු ජනිත කිරීම මගින් අහිංසක ඡන්දදායකයන් රැලි කර ගැනීමේ එල්ලයෙන් යුත් පෙර නොවූ විරූ බොරු මාලාවකින් ඔහුගේ මැතිවරන ප්‍රකාශනය සමන්විත විය. එපමනක් නො ව, ජනගහනයේ විශාල කොටස්වල -- දිවයිනේ යුද කලාපවල වෙසෙන මිලියනයකට ආසන්න ඡන්දදායකයන්ගේ හා එතෙර රැකියාවල යෙදෙන ශ්‍රී ලාංකිකයන්ගේ -- ඡන්ද අයිතිය අහිමි කර තිබුනි. ඔහුගේ සැබෑ බහුතරය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරන ඉතිහාසයේ පැවති පටු ම අගය විය.

දැන් එම රාජපක්ෂ බලයේ සිටී. ඉක්මනින් ම පෙනී යනු ඇත්තේ, රටේ 20 අවුරුදු සිවිල් යුද්ධය අවසානයක් කරා ගෙන ඒම හෝ ජීවන මට්ටම් වැඩි දියුනු කිරීම සම්බන්ධයෙන් ජනගහනයේ අති මහත් බහුතරයකට පවත්නා අභිලාෂයන් සාක්ෂාත් කිරීම ඔහුට කල නො හැකි බව යි.

රාජපක්ෂ සිය මැතිවරන ව්‍යාපාරය ගෙන ගියේ, වත්මන් සටන් විරාමයට ද දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාකච්ඡා කිරීමට ද විරුද්ධ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය සමග සන්ධානගතව ය. ඔහු දැන් “ගෞරවනීය සාමයක්” පොරොන්දු වෙයි. එහි අර්ථය නම් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීම වෙනුවෙන් සාක්ෂාත් කර ගත නො හැකි කොන්දේසි දමන බව යි. දේශපාලනික සාක්ෂරතාවයෙන් යුත් සෑම අයෙක් ම දන්නා පරිදි, මෙය වනාහි සාමය සඳහා නො ව යුද්ධය සඳහා වූ සැලසුමකි.

නොවැම්බර් 19 දා සිය තනතුරේ දිවුරුම් දීමේ දී කල කතාව තුල, රාජපක්ෂ, තම “සාම සැලසුම්” මත හැකි ඉහල ම අවධානය යොමු කරමින්, අසීරු සමබරතාවක් පවත්වා ගෙන යාමේ ප්‍රයත්නයක යෙදුනි. කෙසේ වෙතත්, එසේ කිරීමේ දී, ඔහු ඒකාන්තයෙන් ම පැහැදිලි කලේ, තමන් පෙර පැවති සාම ක්‍රියාදාමය මුලුමනින් ම ප්‍රතික්ෂේප කරන බව යි. සටන් විරාමයට මූලික සංශෝධන ඉල්ලා සිටීම සහ “සාම ක්‍රියාදාමයේ” පහසුකම් සලසන්නා වන නෝර්වේ පිලිබඳව මොන ම සඳහනක් නො කිරීම මගින් ඔහු සිංහල ස්වෝත්තමවාදී ජවිපෙට හා හෙල උරුමයට නිසැක සහනයන් දෙකක් ප්‍රදානය කලේ ය. නෝර්වේ සහ සටන් විරාමය “එල්ටීටීඊය සම්බන්ධයෙන් පක්ෂපාතී” යැයි නැවත නැවතත් හෙලා දකීමට ලක්ව තිබේ. ඔහු විශේෂයෙන් ම ඉන්දියාවට මැදිහත් වන ලෙස ආයාචනා කලේ ය. එය වනාහි ජවිපෙ දිරිගැන්වීම ලැබෙන පියවරකි.

රාජපක්ෂ සිය ප්‍රතිවාදියා වූ එක්සත් ජාතික පක්ෂයේ (එජාප) රනිල් වික්‍රමසිංහ පරාජය කිරීමට සමත් වූයේ බොහෝ සෙයින්, 2001 සිට 2004 දක්වා බලයේ සිටි එජාප නායකත්වයෙන් යුත් ආන්ඩුවේ ආර්ථික පිලිවෙත්වලට එරෙහි මහජන වෛරය ඔහු ගසා කෑ බැවිනි. ජවිපෙ වාචාලයන්ගේ සහාය සහිතව, රාජපක්ෂ පෙනී සිටියේ, ගමක ජීවත් වීම කොයි වගේ ද යන්න තමන් දන්නා බැවින් උපදේශකයන් අවශ්‍ය නො වන “ජනතාවගේ මිනිසෙක්” ලෙස ය. තමන් ඉපදුනේ රත්තරන් හැන්දක් කටේ තබා ගෙන නො වේ යැයි ඔහු පැවසී ය. වෙලඳ පොල ප්‍රතිසංස්කරන වැඩ පිලිවෙල ඉදිරියට ගෙන යන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, විදේශ ආයෝජකයන් හා කොලඹ සංගත ප්‍රභූව කරන ඉල්ලීම්වලට -- පෙර පැවති ශ්‍රීලනිප

නායකත්වයෙන් යුත් ආන්ඩුව කලාක් මෙන් -- නව ආන්ඩුව අනුගත වී ගැනීමත් සමග ම, බොරු පොරොන්දු ද සහිතව, ඔහුගේ සියලු පව එළිදරව් වනු ඇත.

රාජපක්ෂ සහ ඔහුගේ ජවිපෙ ආධාරකරුවන් විසින් ඉදිරියට දමනු ලබන වර්ගෝත්තමවාදයට මොන යම් හෝ විරුද්ධත්වයක් දැක්වීමට තමන් අපොහොසත් බව එජාපය යලිත් වරක් ඔප්පු කර තිබේ. 2002 දී එජාපය එල්ටීටීඊය සමග සටන් විරාමයක් අත්සන් කොට සාකච්ඡා මාලාවක් ආරම්භ කලේ, යුද්ධය මගින් ඇති කෙරුනු දුක් වේදනාවන් අවසන් කිරීමේ උත්සුකතාවකින් නම් නො ව, ආර්ථිකය යලි ගොඩ ගැනීම සඳහා පූර්ව කොන්දේසිය සාමය බවට මහ ව්‍යාපාරිකයන් හා ජාත්‍යන්තර ආයෝජකයන් අවධාරනය කල හෙයිනි. සටන් විරාමය සිංහල අන්තවාදීන්ගේ ප්‍රහාරයන්ට ලක් වන විට, කෙසේ වෙතත්, වාර්ගික දේශපාලනයේ ම කර වටක් ගිලී සිටින එජාපය නැවත නැවතත් එයට යටත් විය.

මැතිවරන ව්‍යාපාරය මුලුල්ලේ ම එම ක්‍රියාදාමය ම සිදු විය: ජවිපෙ සටන් විරාමය හෙලා දැක්ක අතර එජාපය සිය ක්‍රියාවන් ආරක්ෂා කලේ ඒවා එල්ටීටීඊය පරාජය කිරීමේ විධි ක්‍රම බව පවසමිනි. කොලඹ පාලනයට වාසි සහගත කොන්දේසි මත එල්ටීටීඊය සමග සාම ගිවිසුමක් සාක්ෂාත් තර ගැනීම සහතික කරනු ඇති "ජාත්‍යන්තර ආරක්ෂක දැලක්" ගොඩ නැගීමට තමන් සමත් වූ බවට වික්‍රමසිංහ පුරසාරම් දෙඩී ය. තථ්‍ය වසයෙන් ම, ඔහු කර ඇත්තේ, ඔවුන්ගේ අරමුනු වෙනුවෙන් දිවයින තුලට එක්සත් ජනපදයේ හා සෙසු මහ බලවතුන්ගේ වඩා දැවැන්ත මැදිහත්වීම් සඳහා මාවත සැකසීම යි. වොෂිංටනය සාම ක්‍රියාදාමයට පිටුබලය සපයා ඇත්තේ, එය ඒ ආකාරයෙන් ගත් විට යුද්ධයට විරුද්ධ නිසා නො ව, දිවයින තුලත් වඩා පුලුල් ලෙස කලාපය පුරාත් සිය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමේ වඩා ම හොඳ විධි ක්‍රමය සාකච්ඡා බවට එය විශ්වාස කරන බැවිනි.

මැතිවරනයට යන්තම් දින දෙකකට පෙර අතිශයින් ම අර්ථභාරී ආකාරයෙන්, එක්සත් ජනපද සෙනෙට් මන්ත්‍රී මන්ඩලය පෙර නො වූ විරූ ද්වි-පාර්ශ්වික යෝජනාවක් සම්මත කරමින්, ශ්‍රී ලංකාවේ සියලු පක්ෂවලින් ඉල්ලා සිටියේ, "සාකච්ඡා ක්‍රියාදාමයට දිගට ම කැප වී ගෙන ජාතික සංහිඳියාව දිශාවට හැකි සෑම පියවරක් ම ගන්නා" ලෙස යි. "දේශපාලනික, ජනවාර්ගික හා දෘෂ්ටිමය වර්නාවලියේ සියලු ම අංග නියෝජනය කරන අන්තවාදී කන්ඩායම්වල බලය මොට කරන ලෙස විදේශ ආන්ඩුවලින්, තනි පුද්ගලයන්ගෙන් හා කන්ඩායම්වලින්" එය ඉල්ලා සිටියේ ය.

තර්ජනයකට සම වන ආකාරයකින් යෝජනාව මෙසේ සටහන් කලේ ය: "අන්තවාදී සිංහලයන් හා අන්තවාදී දෙමල පක්ෂ හෝ පුද්ගලයන් ඇතුලු ශ්‍රී ලංකාවේ විවිධ දේශපාලන කන්ඩායම්වලට නැවත නැවතත් අරමුදල් හා අනුග්‍රහය සපයා ඇති ප්‍රජාතන්ත්‍රික නො වන විදේශ බලයන් හා පුද්ගලික මූලාශ්‍රයන් පවතින බව එක්සත් ජනපදය දනී." මෙම කුඩා දිවයින තුල මැතිවරනයක් පැවැත්වෙන බව එක්සත් ජනපද කොංග්‍රසය පිලිගෙන ඇත යන කරුන ම ධවල මන්දිරයේ අභිප්‍රාය පසෙකට වී බලා සිටීම නො වන බවට අනතුරු ඇඟවීමකි. ශ්‍රී ලංකාවේ යුද්ධය යලි ඇවිලීමක් මගින් තර්ජනයට ලක් වන, වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා -- විශේෂයෙන් ම ඉන්දියාව සමග එයට පවත්නා සබඳතා තුල -- එක්සත් ජනපදයට පවතී.

එමෙන් ම, වොෂිංටනයේ සගයා වන ඉන්දියාව ද තුනී ලෙස ආවරනිත තර්ජනයක් නිකුත් කර තිබේ. ඉන්දියාව අසල්වැසි "අසාර්ථක රාජ්‍ය" මගින් වට කරනු ලැබ ඇතැයි අගමැති මන්මෝහන් සිං ඩකා නුවර පැවති මෑත දකුනු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ (සාක්) සම්මේලනය ඉස්මත්තේ දී ප්‍රකාශ කලේ ය. බුෂ් පාලනාධිකාරයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" භාෂාවෙන් "අසාර්ථක රාජ්‍යය" යන පදය යොදා ගනු ලැබ ඇත්තේ ආකාරගත අවසරයක් ඇතිව හෝ නැතිව කෙරෙන දේශපාලන හා මිලිටරි මැදිහත්වීම් යුක්තියුක්ත කරනු පිනිස ය. සැබෑ ඇඟවුම වන්නේ, ශ්‍රී ලංකාව යම් හෙයකින් යලි යුද්ධයට ඇද වැටුන හොත් එයට නව දිල්ලිය හා වොෂිංටනය මැදිහත් විය හැකි බව යි, එනයින් එය වඩා පුලුල් හා වඩා විනාශකාරී ගැටුමක් බවට පත් විය හැකි බව යි.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) අවධාරනය කරන්නේ, හුදු ශ්‍රී ලංකාවේ පමනක් නො ව දකුනු ආසියානු කලාපය පුරා කම්කරු පන්තියට මෙම තර්ජනයන් නො තකා සිටිය නො හැකි බව යි. කම්කරුවන්ට, දුගී ගොවීන්ට, තරුන ජනයාට හා වෘත්තිකයන්ට, ඔවුන් එයට කැමති වුවත් නැතත්, සිය අවශ්‍යතා ආරක්ෂා කර ගත හැක්කේ පාලක පන්තියේ සියලු පක්ෂවලින් ස්වාධීනව, සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ, දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගා ගැනීම මගින් ම පමනි. විරෝධතා සහ වර්ජන, ඒවා කෙතරම් සටන්කාමී වුවත්, යුද්ධය දෙසට ලුහුටා යාම නතර කිරීමට හෝ සමාජීයව විනාශකාරී පිලිවෙත් ක්‍රියාවට දැමීම වලකාලීමට සමත් නො වනු ඇත.

සසප මැතිවරන අපේක්ෂකයා ලෙස, මැතිවරන උද්ඝෝෂනය පුරා මා අවධාරනය කලේ, ශ්‍රී ලංකාවේ යුද්ධය නතර කිරීමේ සහ සියල්ලන්ට ම සමාන ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහතික කිරීමේ ක්‍රියා මාර්ගයක්

කම්කරු පන්තික ජාත්‍යන්තරවාදී මූලධර්ම මත පදනම් කල යුතු බව යි. සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවෝ පොදු පීඩනයකට හා පොදු සමාජ අර්බුදයකට මුහුන දී සිටිති. එකම විසඳුම වන්නේ, සියලු වාර්ගික කන්ඩායම්වල පාලක ප්‍රභූන්ට එරෙහිව, නාගරික හා ගම්බද දුගීන්ගේ සහාය සහිතව දේශපාලන බලය සඳහා කරන අරගලයක් -- එනම්, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන් වැදීම -- තුල ඒකාබද්ධ වීම යි.

ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ සසප අරගලය, දෙවන ලෝක යුද්ධයෙන් පසුව කලාපයේ බ්‍රිතාන්‍ය විජිත අධිරාජ්‍යය විස්ථාපනය කරනු වස් පිහිටුවන ලද කෘත්‍රිම හා අශක්‍ය රාජ්‍ය පද්ධතියට විරුද්ධව දකුනු ආසියාවේ කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමේ වඩා පුලුල් මූලෝපායක කොටසකි. පසු ගිය 50 වසරක ඊනියා ස්වාධීනත්වය තුල කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා පීඩිත ජන කන්ඩායම්වල එකදු සමාජ හා ප්‍රජාතාන්ත්‍රික ගැටලුවක් වත් විසඳා නැත. ඒ වෙනුවට, 1947 ඉන්දියාව බෙදීමෙන් අනතුරුව හටගත් ම්ලේච්ඡ වාර්ගික ලේ වැගිරීම යුද්ධයන්ගේ හා ජන ඝාතනවල රූපාකාරයෙන් නො කඩවා පැවතී තිබේ.

සමස්තයක් ලෙස ආසියාව ම, විශේෂයෙන් ම ඉන්දියාව හා චීනය, ජාත්‍යන්තර ප්‍රාග්ධනය දේශීය ධනපතියන් සමග සන්ධානගතව, නිමක් නැති සේ පෙනෙන ලාභ ශ්‍රම සැපයුම් රුදුරු ලෙස සූරා කෑමේ නියුතු, දැවැන්ත නිදහස් වෙලඳ කලාපයක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත. දරිද්‍රතාව නැති කරනවා වෙනුවට, මෙම ආර්ථික සන්තති මගින් සිදුව ඇත්තේ ධනවතුන් හා දුගීන් අතර පරතරය තවත් පුලුල් කිරීම යි. කලාපය පුරා ම, දේශීය ප්‍රභූ කොටස්, සිය බලය හා වරප්‍රසාද පවත්වා ගෙන යනු පිනිස වාර්ගික ආතතීන් අවුලුවමින්, බ්‍රිතාන්‍ය විජිතවාදීන්ගේ පැරනි උපක්‍රමය -- බෙදා පාලනය කිරීම -- යොදා ගනී.

*නිව්ස්වීක්* සඟරාවේ මෑත පල වූ ලිපියක් සමාජ අර්බුදයේ අති මහත් බව අවධාරනය කලේ යඃ "සංඛ්‍යාත්මක අගයන් සැලකූ කල, ආසියාව දිනකට එක්සත් ජනපද ඩොලර් 1ක් හෝ ඊටත් අඩු ආදායමකින් ජීවත් වන මනුෂ්‍ය වර්ගයාගේ දුගීන්ගෙන් 10න් 7කට -- මිලියන 700ක් පමන වන ජනයා -- නිවහන වෙයි. ඊටත් වඩා ජන සංඛ්‍යාවක් දිනකට යන්තම් ඩොලර් 2ක ඒක පුද්ගල ආදායමක් උපයමින්, සමාජ-ආර්ථික හිනි මගේ එක හිනි පෙත්තක එල්ලී සිටියි. සමස්තයක් ලෙස ගත් කල, ආසියානුවන් බිලියන 1.9ක් පමන එම ගෝලීය දරිද්‍රතා රේඛාවේ හෝ ඊට පහලින් ජීවත් වේ. වෙනත් අයුරකින් කිය තොත්, ආසියාවේ දරිද්‍රතාවට ලක් වූ ජනයා දැන් දෙවන ලෝක යුද්ධය අවසානයේ කලාපයේ මුලු ජනගහනය ඉක්මවා යයි."

ශ්‍රී ලංකාවේ මැතිවරන උද්ඝෝෂනය පුරා ම, මා පෙන්වා දුන්නේ, සසප යෙදී සිටින්නේ ඡන්ද එකතු කිරීමේ අභ්‍යාසයක නො ව, ශ්‍රී ලංකාවේ හා කලාපය පුරා කම්කරුවන් අතර සමාජවාදී ක්‍රියා මාර්ගයක අවශ්‍යතාව පිලිබඳව සාකච්ඡාවකට මුල පිරීමේ ව්‍යායාමයක බව යි. ශ්‍රී ලංකාව වැනි කුඩා දිවයිනක් වේවා, ඉන්දියාව හෝ චීනය වැනි වඩා විශාල රටක් වේවා, තනි රටක දේශ සීමා තුල කිසිදු ප්‍රශ්නයක් විසඳාලිය නො හැකි ය. ගෝලීය ප්‍රාග්ධනයට විරුද්ධව සටන් වැදීම පිනිස, කම්කරු පන්තියට තමන්ගේ ම ගෝලීය මූලෝපායක් තිබිය යුතු ය. එනම්, වරප්‍රසාදිත අතලොස්සකගේ ලාභ අවශ්‍යතා වෙනුවට මනුෂ්‍ය වර්ගයාගේ බහුතරයක සමාජ අවශ්‍යතා සාක්ෂාත් කර ගනු වස් සමාජවාදී පිලිවෙත් ඔස්සේ සමාජය යලි සැකසීම පිනිස ආසියාවේ හා ජාත්‍යන්තර කම්කරුවන් ඒකාබද්ධ කිරීම යි.

ශ්‍රී ලංකාවේ සසපට සහයෝගය දුන් හා එයට දැනුවත්ව ඡන්දය දුන්නා වූ ද සෙසු ප්‍රදේශවල සිට අපගේ උද්ඝෝෂනය නිරීක්ෂනය කලා වූ ද ඔබ සැමගෙන් මා ඉල්ලා සිටින්නේ, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නිතිපතා පාඨකයන් බවට පත් වන ලෙස යි, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ක්‍රියා මාර්ගය හා ඉදිරි දර්ශනය බැරෑරුම්ව අධ්‍යයනය කරන ලෙස යි. අන් සියල්ලට මත් වඩා, ඔබ ශ්‍රී ලංකාවේ, ඉන්දියාවේ හෝ ලෝකයේ අන් කුමන කොටසක සිටියත්, ඔබ කල යුත්තේ අපගේ ජාත්‍යන්තර පක්ෂයට බැඳී යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහි සමාජවාදී විකල්පයක් සඳහා සටන් කිරීම ඇරඹීම යි.